

# සංක්‍රමණිකයකුගේ සටහන

### ත්‍රිවිධ හා මෘදු බැල්ම

ඕනෑම නිර්මාණ කරුවෙක් තම නිර්මාණයන් ප්‍රේක්ෂක ජනතාවට ඉදිරිපත් කල පසු ඒ පිළිබඳ විවිධ රසික ප්‍රතිචාරයන් ඇතිවීම ස්වභාවිකය. එය නිර්මාණකරනය බිහිවූ දා පටන් ඇතිවන තත්වයකි. මෙල්බන් නගරයේ වෙසෙන ශ්‍රී ලාංකික ජන සමාජයේ ප්‍රගමනය උදෙසා අවංකව යමක් කරන හෝ කිරීමට උත්සාහ දරන ඕනෑම පුද්ගලයෙක් හෝ සංවිධානයක් කෙරේ සංක්‍රමනිකයා තුල ඇත්තේ ලෙංගතුකමක්. ඒ නිසාම තමයි ගාමිනී රනසිංහගේ ත්‍රිවිධ නාට්‍ය පිලිබඳව (කලා විචාරයක් නොවන) අදහසක් පසුගිය කලාපයක් තුලින් ඉදිරිපත් කලේ. ඒ ඉදිරිපත් කිරීම පිලිබඳ අප්‍රසාදයක් කිසියම් පිරිසකට ඇති වී තිබෙන බවත් දැනගන්නට ලැබුනා. සංක්‍රමනිකයා නම් ඒ අදහස ඉදිරිපත් කලේ සද්චේතනාවකින්. ඒත් සමාජය විනිවිද දකින්නට උත්සහ කරන සමාජ ප්‍රගමනය සඳහා නිර්මාන කරන්නට තැත් කරන කලා කරුවනට තමන්ගේ නිර්මාණ පිලිබඳව කෙරෙන සතුරු විවේචන හා මිතුරු විවේචන තේරුම් ගැනීමට නොහැකි වීමත් එක්තරා අභ්‍යාසයක්. ඒ අභ්‍යාසයේ අනියම් ඵලයක් ලෙස තමයි ජගත්ගේ මෘදු බැල්ම මා දකින්නේ. ඒ නිසාමයි මේ ටික ලියන්න හිතුවේ. සිනමා, නාට්‍ය ගීත හෝ ඕනෑම ක්ෂෙත්‍රයක නිර්මාණකරනයක් උදෙසා තමන් සතු දේපල වත්කම් උගසට තබමින් ආර්ථික සාර්ථකත්වයක් පිලිබඳ අවිනිශ්චිත තත්වයකට මුහුණ දෙමින් දහසක් බාධක අවහිර ජය ගනිමින් නිර්මානකරනයේ යෙදෙන ලාංකික කලාකරුවන්, කාලය-කැපවීම හැර අන් සියලු සැප පහසුකමක්ම ඉහටත් උඩින් ඇති ආර්ථික අලාභයක් වුවද ජීවිතය නිසා වැටීමකට ලක් නොවන තත්වයක ඉඳ නිර්මානකරනයේ යෙදෙන මෙල්බන් කලා කරුවා දෙසත් එකම තලයක හිඳ බැලීම කොතරම් සාධාරනද ?

සාංක්‍රමනිකයා මේ තත්වය දේශපාලනිකව දකින්නේ ඒ නිසාය. ඉපදීමේ සිට මිය යන තෙක් අප ගන්නා මුල් හා අවසන් හුස්ම තෙක් දේශපාලනීකරනය වූ පරිසරයක සිටින අප ඉන් මිදෙන්නේ කෙසේද ? ත්‍රිවිධ පිලිබඳ තක්සේරුවකට ඒමට සංක්‍රමනිකයා ඒ නාට්‍ය පිලිබඳ විශාරදයෙක් නොවුනද දීර්ග කාලීන කලා ඇසුර නිසා යම් ඉවක් පමණක් ඔහුට තිබේ. ඒ අනුව ගාමිනි හා පිරිසට දිගු ගමනක් යා හැකි බව ඔවුන් පෙන්වා තිබේ. යා යුතු මග තෝරා ගත යුත්තේ ඔවුන්මය. අප වඩා කැමති ඔවුන් නිවැරදි මාවතේ යනු දකින්නටය. අවසන් වශයෙන් මෙසේ කියමි. අද දවසේ ප්‍රේක්ෂක රුචිය ඇත්තේ පහල මට්ටමක (සාපේක්ෂ ලෙස) බව සියළු දෙනාම දනියි. එහෙයින් කලාපයේ නාමයෙන් ප්‍රේක්ෂකයන්ට නොවැටහෙන සම්භාව්‍ය කෘතීන් නිපදවීමද, රසිකයන් වහා බාර ගන්නා බොලඳ ලටපට නිපදවීම එකසේ හානි කරයි. අද කල යුත්තේ ප්‍රේක්ෂක රසඥතාවය කිසියම් මට්ටමක් කරා ක්‍රමයෙන් ගෙන ආ හැකි පොදු ජනයා සඳහා නාට්‍ය නිපදවීමය. ඔබ උත්සාහ කළ යුත්තේ ද ඒ සඳහා මේ කලා කරුවන් අප රැක යුත්තේ ද ඒ සඳහාය.

### කාව ගේන්නද ?

L.T.T.E. සංවිධානය කරන ආර්ථික හා මිනිස් ඝාතනයන් ලාංකික ජන සමාජයේ මේ තරමටම සලිත කලේ, ගල් කලේ නැහැ. කිසිම දිනක සලිත කිරීම හා ගල් කිරීම මා දකින්නේ අර්ථ දෙකකින්. සමාජයක් සලිත වන්නේ යුද්ධයේ ඇති ප්‍රචන්ඩ හා බිහිසුනු කම අද්දැකීමෙනි. එහෙත් ගල් වෙන්නේ කිසිත් කර කියා ගත නොහැකි වූ විටය. ආන්ඩුව විසින් කරන යුද්ධයේ මුහුනුවර විසින් ජන සමාජය අපේ ශ්‍රී ලාංකික දේශපාලනය අද පත් කර ඇත්තේ ඛේදජනක ඉරනමකට. එය අපට සිහි ගන්වන්නේ පැරනි පිලි රූ කිහිපයක්. ''ගෙදර ගියොත් අඹු නසී. මග හිටියොත් තෝ නසී", ''උනු නිසා බොන්නත් බැරි කිරි නිසා අහක දාන්නත් බැරි, රැව්ලයි කැඳයි දෙකම ඕන'' වගේ කතා යුද්ධය නිසා ආන්ඩුව හා හෙංචයියන් කරන සියළු ජඩකම් හොරකම් දූෂන වංචා ඉවසා දරා සිටින්නට, මොනවා කලත් උන්ව රැකගන්න සිදුවී තිබීම; සහෝදරවරුන් මුරදේවතාවුන් අතුළු සියළුම පක්ෂ මුහුණදී ඇති කනගාටුදායක තත්වයක්. සියළු දෙනාම මතුරන්නේ එකම මන්තරයක්. උපායන්, උපක්‍රම, ක්‍රමවේදයන් සියල්ලම ගල් වෙලා යුද්ධයෙන්. දෙසැම්බර් 14 වෙනිදා වෙනකම් නැගලා යයි. ඊට පස්සේ හෙමිහිට ගලා යන්න පටන්ගනී. කිසිම කෙනෙකුට අභියෝග වලට මුහුන

*<u>පාඨලී චම්පික පරිසර ඇමතිතුමාගේ දොරමඩලාව තීරු ලිපියෙන් ඔස්ට්‍රේලියාව ගැනත් පසුගිය මහ මැතිවරණය ගැනත් කරලා තිබුණ විග්‍රහය ගැන අපේ සංවේගය. බොහෝ අපහාස සමඟ සාවද්‍ය කරුනුත් එකේ අඩංගු වෙලා තිබුනා.</u>*

දෙන්න අවශ්‍යතාවක් නැතිවීම ජනතාවගේ කරුමයකි. ආපහු මුල ඉඳලා පටන් ගන්න කවුද කැමති. ඒ නිසා පක්ෂයි ජනතාවයි ඇස් කන් පියාගෙන ගල්වෙලා ඉන්නවා. අයවැය සටනත් සමගම නව ඇමතිකම්, වරප්‍රසාද ලැබෙමින්, ජිවන වියදම, විරැකියාව ඉහල යමින් තිබුනත් රටේ ආර්ථිකය ගොඩනැංවීමට නිසි සැලසුමක් නොතිබුණත් මොකද ඉතිං කරන්නෙ. මෙයාව පෙන්නලා අරයව ගේන්නද ?

### දොරමඩලාව

පාඨලී චම්පික පරිසර ඇමතිතුමාගේ දොරමඩලාව තීරු ලිපියෙන් ඔස්ට්‍රේලියාව ගැනත් පසුගිය මහ මැතිවරණය ගැනත් කරලා තිබුණ විග්‍රහය ගැන අපේ සංවේගය. බොහෝ අපහාස සමඟ සාවද්‍ය කරුනුත් එකේ අඩංගු වෙලා තිබුනා. මෙතුමා කෙවින් රඩ් ගේ කම්කරු පක්ෂය ලැබූ ජයග්‍රහනය සමාන කරල තිබුනේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට. මාස්ක්ව අවලංගු කරලා ලෙනින් වත් ලොප් කරලා තිබුනෙ. හරිත විප්ලවය ඕස්ට්‍රේලියාවෙන් ඇරඹෙන බවටයි මෙතුමා බලාපොරොත්තු වන්නේ. විවිධ විෂයන් ගණනාවක විසාරදයෙක් ලෙස හැඳින්වෙන මෙතුමාට කියෝතෝ සංධානයට ඇතුල් වුනා. ඔස්ට්‍රේලියාව කිසිම දිනෙක ඇමරිකාවට එරෙහි ගමනක් නොයන වග අවබෝධ නොවීම පුදුමයි.

ජාතික රාජ්‍ය සංකල්ප ගැන චම්පිකලා සිහින මැව්වට මේ රටවල් තමන්ගේ සුපුරුදු මාර්ගයෙන් පිට නොපනින බව අගේට වැටහෙන්නේ විදේශගතව ජීවත් වන විටයි. ලංකාවේ ජීවත් වෙන කල් බොහොමයක් දේවල් බෙහෝ දෙනෙකුට දේව වාක්‍ය වගේ තමයි. ඒකම තමයි කපටි දේසපාලුවන්ට අපේ රට හොඳ හොඳ තෝතැන්නක් වෙලා තියෙන්නේ.






